# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1688/15 – 2011 ජනවාරි 12 වැනි බදාදා – 2011.01.12

(රජයේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

මගේ අංකය: බල2/1/53.
ඔබේ අංකය: එල්ඩී/05/2006/වීරී/385.

බලපිටිය කාර්මික විද්‍යාලය සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව් ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වන වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ විස්තර:

දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ බලපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 90, වඳදූව නැමති ගමෙහි සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කර ඇති මු.පි.ගා. 3704 සැලැස්මේ සඳහන් කැබලි අංක 1,2,3 සහ 4 ඇතුලත් නවරත්නගොඩබැද්ද නැමති ඉඩම.

01. **කැබලි අංක 01 – නවරත්නගොඩබැද්ද – ප්‍රමාණය: හෙක්. 0.0284**
උතුරට: මාර්ගය සහ හිමිකරු සොයාගත නොහැකි නවරත්නගොඩබැද්ද; නැගෙනහිරට, දකුණට සහ බටහිරට: හිමිකරු සොයාගත නොහැකි නවරත්නගොඩබැද්ද

02. **කැබලි අංක 02 – නවරත්නගොඩබැද්ද – ප්‍රමාණය: හෙක්. 0.0344**
උතුරට: මාර්ගය; නැගෙනහිරට: මාර්ගය සහ කැබලි අංක 2; දකුණට: කැබලි අංක 4 සහ 3; බටහිරට: මාර්ගය.

03. **කැබලි අංක 03 – නවරත්නගොඩබැද්ද – ප්‍රමාණය: හෙක්. 0.0415**
උතුරට: මාර්ගය සහ කැබලි අංක 2; නැගෙනහිරට: කැබලි අංක 2, 4 සහ මු.පි.ඒ. 1288 හි කැබලි අංක 2; දකුණට: කැබලි අංක 4 සහ මු.පි.ඒ. 1288 හි කැබලි අංක 2;බටහිරට: මාර්ගය සහ කැබලි අංක 2.

04. **කැබලි අංක 04 – නවරත්නගොඩබැද්ද – ප්‍රමාණය: හෙක්. 0.0321**
උතුරට: කැබලි අංක 2 සහ මාර්ගය ; නැගෙනහිරට: මාර්ගය, ඩබ්ලිව්. ප්‍රසන්තා සොයිසා හිමිකම් කියන නවරත්නගොඩබැද්ද සහ මු.පි.ඒ. 1288 හි කැබැල්ල; දකුණට: මාර්ගය, ඩබ්ලිව්. ප්‍රසන්තා සොයිසා හිමිකම් කියන නවරත්නගොඩබැද්ද සහ මු.පි.ඒ. 1288 හි කැබලි අංක 2;බටහිරට: කැබලි අංක 3 සහ 2.

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලය ලත් අයවලුන් හෝ 2011 පෙබරවාරි මස 16 යන දින පූ. භා. 10.00 ට බලපිටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුය.

තවද, 2011 පෙබරවාරි මස 09 වන දිනට මත්තෙන් ඒ ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුය.


ආර්. එච්. කමල් රණසිංහ,
ප්‍රාදේශීය ලේකම්,
බලපිටිය


2010 නොවැම්බර් මස 29 වැනි දින,
ප්‍රාදේශීය ලේකම් කාර්යාලය,
බලපිටිය.

01 - 575

## ශුද්ධි පත්‍රිකාවයි

### ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

### 7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

මගේ අංකය: ප්‍රා/ලේ/අගු/ඉ/1/16.
ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය: එල්ඩී/ 05/2005/ඩබ්.එස්/491.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1619/27 හා 2009 සැප්තැම්බර් මස 18 දිනැති *අති විශේෂ ගැසට් පත්‍රයේ* පළවූ ඉහත සඳහන් දැන්වීමේ අ.ග.පි. 255 ට අදාල කැබලි අක්ෂර "ඒ" ලෙස නොව කැබලි අංක 895 වශයෙන් විය යුතු බවත් ප්‍රමාණය හෙක්. 0.3033ක් විය යුතුය. එහි මායිම්.

උතුරට: කැබලි අංක 465 සහ 894; නැගෙනහිරට: කැබලි අංක 894 සහ 467; දකුණට: කැබලි අංක 467 සහ 469; බටහිරට: කැබලි අංක 469 සහ 465 විය යුතු බවත් මෙයින් දැනුම් දෙමි.

රංජිත් යාපා,
ප්‍රාදේශීය ලේකම්,
අඟුණකොලපැලැස්ස

2010 නොවැම්බර් මස 15 වැනි දින,
ප්‍රාදේශීය ලේකම් කාර්යාලය,
අඟුණකොළපැලැස්ස.

01-576

---

## ශුද්ධි පත්‍රිකාවයි

### ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

### 7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

මගේ අංකය: 3/1/132/v/11.
ඉඩම් අමාත්‍යාංශයේ අංකය: එල්ඩී/ 05/2005/අයිආර්/239බී2.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1539/12 හා 2008 මාර්තු මස 03 දිනැති *අති විශේෂ ගැසට් පත්‍රයේ* ඉඩම් අත්පත් කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තිය යටතේ පළ කරණ ලද මාගේ දැන්වීමෙහි 2ඒ පිටුවේ සඳහන් "කැබලි අංක 123 හි ප්‍රමාණය හෙක්. 0.5477ක්" යන්න "ප්‍රමාණය හෙක්. 0.3452 ක්" ලෙස නිවැරදි විය යුතු බව මෙයින් නිවේදනය කරමි.

කේ. ඩී. බී. ජයසිංහ,
ප්‍රාදේශීය ලේකම්,
මාස්පොත.

2010 ඔක්තෝබර් මස 12 වැනි දින,
ප්‍රාදේශීය ලේකම් කාර්යාලය,
මාස්පොත.

01-574/1

---

## ශුද්ධි පත්‍රිකාවයි

### ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

### 7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

මගේ අංකය: 3/1/132/v/11.
ඉඩම් අමාත්‍යාංශයේ අංකය: එල්ඩී/ 05/2005/අයිආර්/239බී2.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1532/14 හා 2008 ජනවාරි මස 17 දිනැති *අති විශේෂ ගැසට් පත්‍රයේ* ඉඩම් අත්පත් කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තිය යටතේ පළ කරණ ලද මාගේ දැන්වීමෙහි 5ඒ පිටුවේ සඳහන් "කැබලි අංක 456 යන්න කැබලි අංක 457" ලෙස නිවැරදි විය යුතු බව මෙයින් නිවේදනය කරමි.

කේ. ඩී. බී. ජයසිංහ,
ප්‍රාදේශීය ලේකම්,
මාස්පොත.

2010 ඔක්තෝබර් මස 12 වැනි දින,
ප්‍රාදේශීය ලේකම් කාර්යාලය,
මාස්පොත.

01-574/2

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.